# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,202 —1960 සැප්තැම්බර් 17 වැනි සෙනසුරාද — 17.9.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1950 අංක 25 දරණ ආහාර පාලන පනත

**අංක 154 දරණ නියෝගය**

1950 අංක 25 දරණ ආහාර පාලන පනතේ 4 (1) (i) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති තැන්පත් විකිරි බණ්ඩාර ඉලංගරත්න වන මම, ලංකාවේ එක තැනක සිට ලංකාවේ තවත් තැනකට ආහාර පාලක තැන විසින් හෝ ප්‍රථමයෙන් සඳහන් කළ තැන ඇතුළත් ප්‍රදේශයේ නියෝජ්‍ය ආහාර පාලක තැන විසින් හෝ සහකාර ආහාර පාලක තැන විසින් හෝ මේ ඉහත අය වෙනුවෙන් නිකුත් කළ බලපත්‍රයක් පිට හෝ නොහොත් එකී බලපත්‍රයක අන්තර්ගත කොන්දේසි පිට හැර පාට කළ වී ඇට සහිත වී ප්‍රමාණයක් ප්‍රවාහණය කිරීම හෝ ගෙනයාම තහනම් කරමි.

එහෙත් මෙම නියෝගයේ ඉහත දක්වෙන තහනම, පහත සඳහන් ක්‍රියාවන්ට බලපවත්වන්නේ නැත :—

(අ) ලංකා රජය වෙනුවෙන් කිසිවෙකු එවැනි වී කිසියම් ප්‍රමාණයක් ප්‍රවාහණය කිරීම හෝ ගෙන යාම; හෝ

(ආ) ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරණු ලැබූ කිසියම් වී ප්‍රමාණයක්, එසේ ලබාගත් ලියාපදිංචි කරණු ලැබූ වී මෝල් හිමියකු විසින් හෝ එකී වී මෝල් හිමියා වෙනුවෙන් යම්කිසි කෙනෙක් එකී වී මෝල් හිමියාගේ ගබඩාවට හෝ ව්‍යාපාරික ස්ථානයට ප්‍රවාහණය කිරීම හෝ ගෙන යෑම.

මෙම නියෝගයෙහි—

"පාටකළ වී ඇට" යනුවෙන් දක්වන්නේ "මැලචයිට්ග්‍රීන්" යන කොළ පාටින් හෝ "කොචිනීස්කාලට්" යන රතු පාටින් හෝ වෙනත් පාට කරන දෑයකින් කෘත්‍රිම ලෙස පාට කළ විට කොළ හෝ රත් පාටක නැගුණු වී ය.

"ලියාපදිංචි කරන ලද වී මෝල් හිමියෙක්" යනුවෙන් දක්වන්නේ ගාස්තුවක් පිට හෝ ඒ වෙනුවට දෙන දීමනා පිට වී කෙටීම සඳහා ගොවිජන සේවා කොමසාරිස් තැන යථාකාලයට ලියාපදිංචි කළ කෙනෙකි.

වී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති.

1960 සැප්තැම්බර් මස 14 දින,
කොළඹදී ය.

9166


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රණය කරන ලදී.

889—ජේ. ඇන්. ආර් 12030—5,000 (9/60)